**වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව**
**වවුනියා දිස්ත්‍රික්කය**
**----------------------------------------------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන
-----------------

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 02 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2** **තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වවුනියා දකුණ දෙමළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------------**

**1.3.1** **ගිණුම්කරණ අඩුපාඩු**
**--------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ආරම්භක ශේෂ වශයෙන් වත්කම් ඇතුළත් කර තිබුණද භෞතිකව එම වත්කම් නොතිබුණු අතර එම ශේෂ වර්ෂය අවසානයේ වත්කම්වල අගයට ඇතුළත් කර තිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දිනට වත්කම්වල වටිනාකම රු.1,794,951 කින් වැඩිපුර දක්වා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සභාව විසින් ප්‍රාග්ධන වැඩ සම්පූර්ණ කර නොතිබූ බැවින් රු.11,079,181 කින් ණයහිමි ශේෂය වැඩි වී තිබුණි. එබැවින් ජංගම බැරකම් වැඩිපුර දක්වා තිබුණි.

**1.3.2** **ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**
**---------------------------------------**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 1988 වර්ෂයේදී සභාවට ප්‍රදානය කරන ලද රු.38,280 ක් වූ ආයුර්වේද පරිත්‍යාග මේ දක්වා ලබාගෙන නොතිබුණි. හිඟ රජයේ ප්‍රදාන වශයෙන් දිගු කාලයක් එය ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) අත්තිකාරම් ගිණුමේ දිගු කාලීනව ඉදිරියට එන රු.22,277 ක මුදලක් නිරවුල් කිරීම සඳහා මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**1.3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**----------------------------------------------------**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා රීති සංග්‍රහය (මූල්‍ය සහ පරිපාලන) රීති අංක 217 | සභාව විසින් උපයෝජනය කරනු ලබන සියලුම ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | එකතුව රු.3,714,080 ක කල් ඉකුත් වූ තැන්පතු, තැන්පත් ගිණුමේ දීර්ඝ කාලයක සිට පැවතුණද, මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.1 ඡේදය | සෑම මාස හයකට වරක්ම වාහනවල ඉන්ධන ටැංකිය සම්පූර්ණයෙන්ම පුරවා වාහනය ධාවනයේ යොදවා ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**-------------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.7,691,403 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.1,144,911 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,546,492 ක වර්ධනයක් දැක්වුණි.

**2.2 ආදායම් පරිපාලනය**

**------------------------**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**----------------------------------------**

අයවැය ඇස්තමේන්තු විධිමත්ව සකස් කර නොතිබූ බැවින් හා ඇස්තමේන්තු නිසි පරිදි සැලසුම් කර වැඩසටහන් ගතකර නොතිබූ බැවින් අයවැයගත ආදායම හා තථ්‍ය ආදායම අතර රු.5,084,142 ක විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.

**2.2.2 දේපල මත වරිපනම් බදු**

**-----------------------------**

සභාවේ විෂය පථය යටතේ වන දේපල සඳහා ප්‍රත්‍යාගණනයක් පසුගිය වර්ෂ 10 කට වැඩි කාලයක් සඳහා සිදුකර නොතිබූ අතර ඒ සඳහා වරිපනම් බදු ආදායම අයකර ගෙන නොතිබුණි.

**2.2.3 වෙනත් ආදායම්**

**-------------------**

සභාව සතුව ඇති ජේ.සී.බී යන්ත්‍ර හා මෝටර් ග්‍රේඩර් කුලියට දීමෙන් ලැබිය යුතුව ඇති රු.296,738 ක මුදලක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

**(අ) උසාවි දඩ මුදල්**

**------------------**

වවුනියා අධිකරණයෙන් විවිධ ආඥා පනත් යටතේ 2016 දෙසැම්බර් 31 දිනට සභාවට ලැබිය යුතු රු.2,932,360 ක් වූ උසාවි දඩ මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**(ආ) මුද්දර ගාස්තු**

**----------------**

2001 වර්ෂයේ සිට 2016 දක්වා කාලපරිච්ඡේදය සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් සභාවට ලැබිය යුතු රු.18,387,230 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.5 සමාලෝචිත වර්ෂය තුළ උපමාන පාදක ප්‍රදාන වැඩසටහන යටතේ (CBG) ග්‍රාම සංවර්ධන සමිතිය විසින් සිදු කරන ලද ඕමන්තෙයි රාජ්‍ය නිලධාරීන්ගේ නිවාස යෝජනා ක්‍රමයේ දෙවන පටුමඟ සඳහා බොරළු ඇතිරීමේ කර්මාන්තය සඳහා සභාව විසින් රු.100,000 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණි. පරිගණක වාර්තාව අනුව රු.82,984 ක මුදලක් මේ සම්බන්ධයෙන් ගෙවිය යුතු වුවද, අවසාන ගෙවීම වශයෙන් රු.99,372 ක මුදලක් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.16,388 ක මුදලක් වැඩිපුර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

**2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

(අ) පළාත් පාලන කොමසාරිස් විසින් ලබා දී තිබූ රු.262,500 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍ර 02 ක් මේ දක්වා නිෂ්කාර්යව පැවතුණි. මේ සම්බන්ධයෙන් එම යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනීමට හෝ විධිමත් පරිපාටි අනුගමනය කර විකිණීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ වාහන 23 ක් පැවතියද මෙම වාර්තාවේ දිනය දක්වාම එම වාහනවල අයිතිය පවරා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

(i) දීර්ඝ කාලයක සිට සභාවට අයත් වාහන දෙකක් නිෂ්කාර්යව තිබෙන අතර ඒවා භාවිතයට ගැනීමට හෝ විධිමත් පරිපාටි අනුගමනය කර විකුණා දැමීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ii) උපමාන පාදක ප්‍රදාන වැඩ සැලසුම් යටතේ සභාව විසින් වෙන්කර තිබූ තොනික්කාල් සතිපොළ ඉදිකිරීම් වැඩ කිශාලන් ඉදිකිරීම් සමාගම විසින් රු.814,719 ක පිරිවැයකට 2015 නොවැම්බර් 15 දින නිම කර තිබුණි. කෙසේ වුවද, මෙම වාර්තාවේ දිනය දක්වාම එය නිෂ්කාර්යව පැවතුණි.

**3.** **පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(i) ආදායම් රැස් කිරීම්
(ii) ස්ථාවර වත්කම්
(iii) අත්තිකාරම් ලැබීම්
(iv) අත්තිකාරම් ගෙවීම්
(v) ප්‍රාග්ධන වැඩ
(vi) ප්‍රධාන ලෙජරය පවත්වා ගැනීම